LAKSHMAN KADIRGAMAR INSTITUTE OF INTERNATIONAL RELATIONS AND STRATEGIC STUDIES

මාධ්‍ය නිවේදනය

**ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දෙවන විදේශ ප්‍රතිපත්ති සංවාදයේදී 'ඊශ්‍රායල්-පලස්තීන ගැටුම සහ එහි ප්‍රතිවිපාක: ගෝලීය දෘෂ්ටිකෝණ' පිළිබඳව සාකච්ඡා කෙරෙයි**

ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දෙවන විදේශ ප්‍රතිපත්ති සංවාදය 'ඊශ්‍රායල්-පලස්තීන ගැටුම සහ එහි ප්‍රතිවිපාක: ගෝලීය දෘෂ්ටිකෝණය' යන මැයෙන් 2023 නොවැම්බර් 15 වන බදාදා දින ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපායික අධ්‍යයනයන් සඳහා වන ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. සෑම තෙමසකට වරක් ම පැවැත්වෙන මෙම විදේශ ප්‍රතිපත්ති සංවාද මාලාවේ දී විවිධාකාර වූ දෘෂ්ටිකෝණයන් සහිත ප්‍රවීණයන් සමඟින් කාලීන විදේශ ප්‍රතිපත්ති ගැටළු සහ ශ්‍රී ලංකාවට සහ කලාපයට එමඟින් ඇති වන ඇඟවුම් සාකච්ඡා කෙරේ. ගාසා හි වර්තමාන තත්වය සහ එමඟින් කලාපයට සහ ලෝකයට ඇති වන ඇඟවුම් මූලික කරගෙන, දැනට සිදුවෙමින් පවතින ඊශ්‍රායල්-පලස්තීන ගැටුම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මෙවර සංවාදය වේදිකාවක් සැපයුවේය. මෙම සංවාදය රාජ්‍යදූත මෙහෙයයන්හි ප්‍රධානීන්, රාජ්‍ය නිලධාරීන්, ශාස්ත්‍රඥයින්, සිවිල් සමාජය, ජනමාධ්‍යවේදීන් සහ සිසුන් ගෙන් සමන්විත නියෝජනාත්මක සභාවක් සමඟ විද්වත් මණ්ඩල සාකච්ඡාවක් සහ ප්‍රශ්න - උත්තර සැසියක් සඳහා ඉඩ ප්‍රස්තා සැලසුවේය.

මෙවර සංවාදයේ මාතෘකාව හඳුන්වා දෙමින් මෙම සැසිය මෙහෙයවූ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ විධායක අධ්‍යක්ෂ තානාපති රවිනාථ ආර්යසිංහ මහතා වර්තමානයේ සිදුවෙමින් පවතින ඊශ්‍රායල්-පලස්තීන ගැටුම පිළිබඳව සංදර්භය සැපයුවේය. ඔක්තෝම්බර් 7 වැනිදා සිදුවූ හමාස් සංවිධාන ප්‍රහාරය සහ ප්‍රාණඇපකරුවන් ගැනීමෙන් පසුව ඊශ්‍රායලීය ආරක්ෂක අංශ විසින් අරගත්, දැනට ද නොකඩවා පවත්වාගෙන යන ප්‍රතිහිංසාකාරී පියවරයන් මෙන්ම, ඉන් පසුව දෙපිල අතර ඇතිවූ එදිරිවාදිකම් වල කාලරාමුව ද ඔහු විසින් විස්තර කරන ලදී. මෙම ගැටුම හේතුවෙන් සිදුවූ මරණ, තුවාල ලැබූවන් සහ අවතැන්වූවන් සංඛ්‍යාව ගෙනහැර පාමින් ඔහු කියා සිටියේ එක්සත් ජාතීන්ගේ සංගමයේ මහලේකම් ඇතුළු මානුෂවාදී සංවිධාන රැසක් විසින් කිහිපවරක් සිදු කරන ලද ඉල්ලීම් හමුවේ වුව ද සටන්විරාමයක් සඳහා එකඟවීමට පාර්ශවයන් අසමත් වී ඇති බවයි. ගැටුම ඇතිවී සති පහකට අධික කාලයක් ගතවී ඇතත් මේ පිළිබඳව පියවර ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය අසමත් වී ඇති ආකාරයත්, මානව හිමිකම් කවුන්සිලය විසින් මේ පිළිබඳව විශේෂ සැසියක් කැඳවීමට අපොහොසත් වී ඇති ආකාරය මෙන්ම, මෑතකදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරයදී පැවැත්වුණු ඡන්දයේ දී පිළිබිඹු වූ අන්තර්ජාතික මානුෂීය සහ මානව හිමිකම් සම්මතයන් භාවිතයේදී පිළිපැදෙන දෙබිඩි පිළිවෙත පිළිබඳව ද ඔහු අවධානය යොමු කරේ ය. ඔහු තවදුරටත් අවධාරණය කර සිටියේ මෙමඟින් අතීතයේ සිදුවූ, වර්තමානයේ සිදුවන, සහ අනාගතයේ දී සිදුවිය හැකි ගැටුම් ඇගයීම සඳහා මුල් බැසගත් ඇඟවුම් ඇති කරන බවයි.

සාකච්ඡාව ආරම්භ කරමින් විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තාරක බාලසූරිය මහතා ශ්‍රී ලංකා රජයේ සහ ප්‍රජාවගේ දෘෂ්ටිකෝණය ගෙනහැර පෑවේය. ශ්‍රී ලංකා රජය හමාස් සංවිධානය ඔක්තෝම්බර් 7 වැනිදා සිදු කරන ලද ප්‍රහාරය හෙලා දකින බවත් ඊශ්‍රායලයට තම රාජ්‍ය ආරක්ෂා කරගැනීමට ඇති අයිතිය පිළිගන්නා බවත් ඔහු කියා සිටියේය. එලෙසම, මෙම ප්‍රහාරය හමුවේ ඊශ්‍රායලය විසින් සිදුකරන ලද ප්‍රතිප්‍රහාර අසමානුපාතික බවද ශ්‍රී ලංකා රජය පිළිගන්නා බව සහ පලස්තීන මෙන්ම ඊශ්‍රායල වැසියන්ගේද ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම කලාපයේ සටන්විරාමයක් සඳහා සිදුකෙරෙන ඉල්ලීම් සඳහා සහය දක්වන බවද ඔහු ප්‍රකාශ කළේය. අන්තර්ජාතික සංවිධාන මෙම කලාපයේ උද්ගත වී ඇති ගැටළු වලට මුල් වූ නිදන්ගත හේතු ඉලක්ක කරගනිමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය සහ අන්තර්ජාතික නීති මත පදනම් වූ ක්‍රියාපිළිවෙලක් නොමැතිවීම පිළිබඳව ද ඔහු අවධානය යොමු කළේය. ගරු රාජ්‍ය අමාත්‍යතුමා ශ්‍රී ලංකාවේ ඡන්දයෙන් තේරීපත්වුණු නිලධාරීන් ගේ මතය පැහැදිලි කරමින් තවදුරටත් පවසා සිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් 157 දෙනෙකු විසින් පලස්තීනයට සහය දක්වා එක්සත් ජාතීන්ගේ සංගමයට යොමු කෙරුණු ලිපියකට අත්සන් තැබූ බවයි. ශ්‍රී ලාංකික මහජනයා මෙන්ම පොදුවේ ගෝලීය දකුණේ ප්‍රජාව පලස්තීනය කෙරෙහි අතිමහත් සහයක් දක්වන බව පැවසූ ඔහු, තම ස්වාර්ථය තකා

මෙම ගැටුම තවදුරටත් දීර්ඝ කරන බටහිර රාජ්‍යයන්ගේ ක්‍රියාකලාපය සහ අරමුණු පිළිබඳව ප්‍රශ්න කළේය.

මෙම සාකච්ඡාවට සහභාගීවුණු අන්තර්ජාතික රතුකුරුස කමිටුවේ ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයේ ප්‍රධානී සෙවෙරින් ශපාස් මහත්මිය (Ms. Severine Chappaz) ගාසාහි මානුෂවාදී සන්දර්භය ගෙනහැර පාමින් මෙම කලාපයේ සිවිල් වැසියන්හට සහන සපයන සංවිධාන වලට මුහුණපෑමට සිදුවී ඇති විවිධ අභියෝග විස්තර කළේය. අන්තර්ජාතික මානුෂවාදී නීතිය සිවිල් වැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඇති වඩාත්ම පරිපූර්ණ සහ ප්‍රායෝගික මෙවලම වන බව අවධාරණය කල ඇය පවසා සිටියේ මෙම ගැටුමේ තීව්‍රතාව මැඩපැවැත්වීම සඳහා එම නීති රැකීම අත්‍යාවශ්‍ය බවයි. අන්තර්ජාතික රතුකුරුස කමිටුවේ ස්ථාවරය නැවත හුවාදක්වමින් ශපාස් මහත්මිය පවසා සිටියේ සියලුම සිවිල් වැසියන් මෙන්ම ඔවුන්ගේ ජල පහසුකම්, වෛද්‍ය පහසුකම් වැනි අත්‍යාවශ්‍ය සිවිල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම, ප්‍රාණඇපකරුවන් වහාම නිදහස් කිරීම, සිවිල් වැසියන්ට සටන් පවතින කලාපයන්ගෙන් පිටවීමට ඇති නිදහස ආරක්ෂා කිරීම අත්‍යාවශ්‍ය බවයි.

ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකානු මහ කොමසාරිස් අතිගරු සැන්ඩිල් එඩ්වින් ශාක් මහතා (H.E. Sandile Edwin Schalk) පවසා සිටියේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය රැකීමට අපොහොසත් වීම නිසා සාපරාධී හැසිරීම් සාමාන්‍යකරණය වී ඇති බවත් සාමාන්‍ය හැසිරීම් සාපරාධි ක්‍රියා බවට පත්ව ඇති බවත්ය. ඊශ්‍රායලය විසින් නීතිවිරෝධී ලෙස ගාසා තීරය අත්පත් කරගැනීම සහ ඊශ්‍රායලය විසින් සිදුකරන ලද සධාරනීකරණය කල නොහැකි යුද අපරාද වෙත අවධානය යොමු කරමින් ඔහු ප්‍රශ්න කලේ ප්‍රදේශ බලෙන් අත්පත් කරගත් හමුදාවකට එම ප්‍රදේශ රැකගැනීමට අයිතියක් ඇති ද බවයි. වහාම සටන් විරාමයකට එළඹීමේ වැදගත්කම අවධාරණය කල ඔහු එලෙස සටන් විරාමයකට සහ මානුෂවාදී කොරිඩෝර ස්ථාපිත කිරීමකට සහය දක්වමින් ඡන්දය භාවිත නොකරන පාර්ශව ගැන විවේචනාත්මක ලෙස අදහස් දැක්වීය. එක්සත් ජාතීන්ගේ සංගම් පද්ධතියේ පවතින දෝෂසහගත බව අවධාරණය කරමින් මහ කොමසාරිස්වරයා පවසා සිටියේ එම සංගමය වෙනස්වන ගෝලීය ජනසංයුතියට ගැලපෙන ලෙස අනුවර්තනය වීමට අපොහොසත් වී ඇති බවත්, සංගමය ස්ථාපිත කරන ලද සමයේදී බලය හෙබවූ ආරම්භක සාමාජික රටවලට තවමත් වැඩි බලයක් සහ නියෝජනයක් සපයන බවයි. බල දේශපාලනය සහ විපරීත බල ව්‍යුහයන් නිසා බහුපාර්ශවීය සංවිධාන අන්තර්ජාතික මානුෂවාදී නීතිය රැකීමට අසමත් වී ඇති බව පැවසූ ඔහු, ගෝලීය දකුණ ජාත්‍යන්තර සබඳතා කෙරෙහි වඩා ප්‍රායෝගික සහ සංසක්ත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් මෙම තත්වය වෙනස් කිරීමට පටන්ගෙන ඇති බවද පැවසීය. මිලිටරි බලය මත පදනම්ව සන්ධාන ගොඩනගා ගැනීම තුලින් ගෝලීය බලතුලනය කෙරෙහි නව තර්ජන එල්ලවන බව ද ගෝලීය ආරක්ෂාව සම්බන්දයෙන් භයානක ඇඟවුම් ඇති කරන බව ද මහ කොමසාරිස්වරයා පවසා සිටියේය. ඔහු තවදුරටත් පවසා සිටියේ මෙවැනි ගෝලීය නැඹුරුතා මැඩපැවැත්වීම සහ සීමාකිරීම උදෙසා වැදගත් වගකීමක් ගෝලීය දකුණ මත පැවරී ඇති බවයි.

මෙම විද්වත් මණ්ඩල සාකච්ඡාව පැමිණ සිටි නොයෙක් විද්වතුන්ගේ විදසුන් අදහස් වලින් ද පෝෂණය විය. හිටපු විදේශ ලේකම් තානාපති එච්.එම්.ජී.එස්. පලිහක්කාර මහතා, හිටපු එයාර් චීෆ් මාෂල් ගගන් බුලත්සිංහල මහතා, INSSSL විධායක අධ්‍යක්ෂ කර්නල් නලීන් හේරත් මහතා, ශ්‍රී ලංකාවේ යුරෝපා සංගමයේ නියෝජිත කණ්ඩායමේ නියෝජ්‍ය තානාපති ලාර්ස් බ්‍රෙඩල් මහතා, ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ හිටපු විධායක අධ්‍යක්ෂ අචාර්ය ඩී.එල්. මෙන්ඩිස් මහතා, විදේශ ප්‍රතිපත්ති විශ්ලේෂක උදිත දේවප්‍රිය මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන කරන සිසුන් ද මෙහිදී අදහස් දැක්වීය. සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව විසින් නිසි පියවර නොගැනීම, මානුෂවාදී හේතුන් මත සටන් තාවකාලිකව නැවත්වීම, එක්සත් ජාතීන්ගේ මානවහිමිකම් කවුන්සිලය විසින් මානවහිමිකම් කඩවීම පිළිබඳව වගවීම කෙරෙහි දක්වන දෙබිඩි ප්‍රතිපත්තිය, බහුපාර්ශවීය සංවිධාන තුල ගෝලීය දකුණට ඇති බලය සහ ගැටුම් තත්වයන් තුල රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ විකාශනය

වන භූමිකාව යන මාතෘකා ඔස්සේ අදහස් දැක්විණි. විද්වත් දේශක මණ්ඩලය පැමිණ සිටින්නන් සමඟ තවදුරටත් සාකච්ඡාවේ යෙදෙමින් සංවාදය සාරවත් කල අතර, සහභාගිවන්නන් උනන්දු කරමින් ඔවුන් පවසා සිටියේ මෙම ගැටුම මෙන්ම අනිකුත් කාලීන කලාපීය සහ ගෝලීය ගැටළු පුළුල් ගෝලීය දෘෂ්ටිකෝණයක් තුලින් විමසීමෙන් වඩාත් පරිපූර්ණ වූ අවබෝධයක් ලබාගත හැකි බවයි.